ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

**අ.පො.ස. (උ.පෙළ) විභාගය / க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2025**

විෂය අංකය / பாட இலக்கம்: **25A**

විෂයය / பாடம்: **ඉන්දීය ඉතිහාසය**

**ලකුණු දීමේ පටිපාටිය / புள்ளி வழங்கும் திட்டம்**

**I පත්‍රය / பத்திரம் I**

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 3 | 21. | 1 | 31. | 2 |
| 02. | 4 | 12. | 4 | 22. | 5 | 32. | 4 |
| 03. | 1 | 13. | 5 | 23. | 2 | 33. | 3 |
| 04. | 3 | 14. | 2 | 24. | 5 | 34. | 1 |
| 05. | 2 | 15. | 4 | 25. | 3 | 35. | 5 |
| 06. | 5 | 16. | 4 | 26. | 2 | 36. | 1 |
| 07. | 4 | 17. | 2 | 27. | 5 | 37. | 4 |
| 08. | 1 | 18. | 1 | 28. | 2 | 38. | 5 |
| 09. | 1 | 19. | 5 | 29. | 3 | 39. | 2 |
| 10. | 2 | 20. | 4 | 30. | 1 | 40. | 4 |

✪ විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට / ஒரு சரியான விடைக்கு ලකුණු 01 බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் 1 × 40 = 40

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

ඉන්දීය ඉතිහාසය II (II කොටස)
இந்திய வரலாறு II (பகுதி II)
History of India II (Part II)

25 A S II

ඉන්දීය ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා

**උපදෙස්:**

- පිළිතුරු සැපයිය යුතු **මුළු** ප්‍රශ්න සංඛ්‍යාව **හතරකි.**
- **II කොටස A, B** හා **C** ලෙස කොටස් **තුනකින්** සමන්විත වේ.
- **A කොටසේ** ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **B** හා **C කොටස්වලින්** එක් කොටසකින් අවම වශයෙන් **එක** ප්‍රශ්නයක්වත් තෝරා ගෙන **තවත්** ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.

(**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ඉන්දියාවේ දළ සිතියමක් I කොටස** සමඟ සපයා ඇත.)

## A කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

(i) පුරුෂපුරය (ii) හින්දුකුෂ් (iii) මොහෙන්ජොදාරෝ
(iv) භාරුකච්ඡ (v) සත්පුර කඳුවැටිය (vi) ගෝධාවරී නදිය
(vii) කාලිංග (viii) කනෞජ් (ix) උජ්ජේනි
(x) පාඨලිපුත්‍ර (xi) සත්ලෙජ් (xii) බටහිර ඝාට්ස්

(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගිනි.)

## B කොටස

2. ඉන්දියානු ඉතිහාසය හැඩගැස්වීමෙහිලා වයඹදිග දුර්ගමාර්ග බලපා ඇති ආකාරය පහත සඳහන් ක්ෂේත්‍ර යටතේ පරීක්ෂා කරන්න.

(i) ඉන්දියාවට බලපෑ සංක්‍රමණ හා ආක්‍රමණ (ලකුණු 08 යි)
(ii) ඉන්දියාවෙන් බාහිර ලෝකයට සිදු වූ බලපෑම , (ලකුණු 08 යි)

3. ක්‍රි.පූ. 6 වන සියවසේ උතුරු ඉන්දියාවේ පැවති දේශපාලන හා ආගමික තත්ත්වය පරීක්ෂා කරන්න. (ලකුණු 16 යි)

4. "මෞර්ය අධිරාජ්‍යය බිඳවැටීම සිදු වූයේ අසෝක රජුගේ ප්‍රතිපත්තිවලට දැක්වූ බ්‍රාහ්මණ විරෝධය නිසා ය."

(i) මෞර්ය අධිරාජ්‍යයේ අගනුවර නම් කරන්න. (ලකුණු 01 යි)
(ii) මෞර්ය රාජධානියේ පළමුවන හා දෙවන පාලකයන් පිළිවෙළින් නම් කරන්න. . (ලකුණු 02 යි)
(iii) අවසාන මෞර්ය පාලකයාගෙන් රජකම පැහැරගත් සේනාපතිගේ නම කුමක් ද? (ලකුණු 01 යි)
(iv) බ්‍රාහ්මණ විරෝධය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් මෞර්ය අධිරාජ්‍යය බිඳවැටීමට හේතු වූ සාධක සාකච්ඡා කරන්න. (ලකුණු 12 යි)

5. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑ ම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ බිඳවැටීම
(ii) පශ්චාත් වෛදික යුගයේ සමාජය
(iii) මෙගස්තිනිස්
(iv) සංගම් සාහිත්‍යය , (ලකුණු 08 × 2 = 16 යි)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

## C කොටස

6. ඉන්දියාවේ දේශපාලන හා සංස්කෘතික වර්ධනය කෙරෙහි කුෂාණයන්ගේ දායකත්වය විචාරාත්මක ව පරීක්ෂා කරන්න. (ලකුණු 16 යි)

7. "දෙවන චන්ද්‍රගුප්ත රජු විසින් ගුප්ත අධිරාජ්‍යය උච්චස්ථානයට පත්කරන ලදී."
   - (i) දෙවන චන්ද්‍රගුප්ත රජුගේ මව සහ පියා නම් කරන්න. (ලකුණු 02 යි)
   - (ii) දෙවන චන්ද්‍රගුප්ත රජු සමයේ දී ඉන්දියාවට පැමිණි චීන භික්ෂුව නම් කරන්න. (ලකුණු 01 යි)
   - (iii) ගුප්ත අධිරාජ්‍යයේ උන්නතිය උදෙසා දෙවන චන්ද්‍රගුප්ත රජු පැවැත්වූ විවාහ සම්බන්ධතා පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 03 යි)
   - (iv) දෙවන චන්ද්‍රගුප්ත රජු ගුප්ත අධිරාජ්‍යය උච්චස්ථානයට ගෙන ආවේ කෙසේ දැයි සාකච්ඡා කරන්න. (ලකුණු 10 යි)

8. රාජේන්ද්‍ර චෝළ රජු කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් චෝළ පාලකයන්ගේ යුද ජයග්‍රහණ විස්තර කරන්න. (ලකුණු 16 යි)

9. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑ ම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.
   - (i) ස්කන්ධගුප්ත රජු
   - (ii) ත්‍රිකෝණ අරගලය
   - (iii) පල්ලව කලාව හා ගෘහනිර්මාණ ශිල්පය
   - (iv) අරාබි සහ තුර්කි ආක්‍රමණ

(ලකුණු 08 × 2 = 16 යි)

***

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]


ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

| | | |
|---|---|---|
| ඉන්දීය ඉතිහාසය II<br>இந்திய வரலாறு II<br>History of India II | 25 A | S |

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. 1

විභාග අංකය / சுட்டெண் / Index No. ..............................




අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



## B කොටස

**2.** ඉන්දියානු ඉතිහාසය හැඩගැස්වීමෙහිලා වයඹදිග දුර්ගමාර්ග බලපා ඇති ආකාරය පහත සඳහන් ක්ෂේත්‍ර යටතේ පරීක්ෂා කරන්න.

(i) ඉන්දියාවට බලපෑ සංක්‍රමණ හා ආක්‍රමණ (ලකුණු 08 යි)

- ➢ පැරණි ඉන්දියාවේ ඉතිහාසය හැඩගැස්වීමෙහිලා බලපෑ හු ලක්ෂණ අතර වයඹදිග ඉන්දියාවේ පිහිටි ඛයිබර්, බෝලාන්, මක්‍රාන් කපොලු ප්‍රධාන දායකත්වයක් ලබාදී තිබේ.
- ➢ ඇෆ්ඝන්, සුලෙයිමාන්, හින්දුකුෂ් කඳු මුල්කොට මෙම කපොලු මාර්ග පිහිටා ඇත.
- ➢ වයඹදිග පිහිටි කපොලු අතර ඛයිබර් කපොල්ල ඉතා වැදගත් විය. එයට හේතු වූයේ මෙය කාබුල් නදී නිම්නයේ සිට පෙෂවෝර් දක්වා වැටී තිබීමයි.
- ➢ මධ්‍ය ආසියාවේ කවර දෙසක සිට වුවද ඔක්සස් නිම්න වෙත සංක්‍රමණය වූ අයට ඉන්දියාවට පිවිසීමට තිබූ පැරණි මාර්ගය වූයේ ඛයිබර් කපොල්ල හරහා තිබූ මාර්ගයයි.
- ➢ ඛයිබර් කපොල්ලට දකුණු දෙසින් සුලෙයිමාන් කඳුවලට බටහිර දිසාවෙන් බෝලාන් කපොල්ල පිහිටා තිබේ.
- ➢ පර්සියාවේ හෙල්මැන්ඩ් ගංගාධාරයට පැමිණෙන අයෙකුට පහසුවෙන් ඉන්දියාවට පිවිසිය හැකි මාර්ගය බෝලාන් කපොල්ල හරහා වැටී ඇත.
- ➢ බෝලාන් කපොල්ලට සැතපුම් 300ක් පමණ දකුණු දිසාවට වන්නට කිර්තාර් කඳු හා අරාබි මුහුද අතර මක්රාන් කපොල්ල පිහිටා තිබේ.
- ➢ වයඹදිග පිහිටි කපොලු ත්‍රිත්වයෙන් බොහෝ සංක්‍රමණ මෙන්ම ආක්‍රමණ එල්ල වූයේ ඛයිබර් කපොල්ල හරහාය. (ආර්ය, ඇලෙක්සැන්ඩර්, බැක්ට්‍රියන් ග්‍රීක, ඉන්දු ග්‍රීක, ශක, පාර්තියන්, කුෂාණ, හූණ, තුර්කි )
- ➢ මධ්‍ය ආසියාවේ සිට පැමිණි ආර්යයන් ඉන්දියාවට ඇතුළුවීමේදී ඛයිබර් කපොල්ල භාවිත කර ඇත.
- ➢ පළමුවැනි ඩේරියස්, මහා ඇලෙක්සැන්ඩර්, චින්ගිස්ඛාන්, ස්වකීය යුධ කටයුතු සඳහා ඛයිබර් කපොල්ල භාවිත කළේය.
- ➢ චන්ද්‍රගුප්ත මෞර්ය රජු ඛයිබර් කපොල්ලේ ආරක්ෂාව තර කළ අතර මධ්‍ය ආසියාවට බලය ව්‍යාප්ත කිරීමේදී මෙම කපොල්ල භාවිතයට ගැනීම.
- ➢ ඇෆ්ඝනිස්ථානයෙන් එල්ල වුනු තර්ජන හා ආක්‍රමණවලදී වැදගත් වූයේ බෝලාන් කපොල්ලයි.
- ➢ ශකවරුන් ඉන්දියාවට ආක්‍රමණ එල්ල කරනු ලබුවේද බෝලාන් කපොල්ල හරහාය.
- ➢ බෝලාන් කපොල්ල ආරක්ෂා කිරීමට කුර්දි ගෝත්‍රික ජනයා ස්ථානගත කර ඇති බවට සාධක හමුවීම.
- ➢ ඝස්නි මහමුද්, සබුක්තිජින්, ඝූර් මුහම්මද්, කුටුබ්උද්දීන් බෝලාන් කපොල්ල හරහා පැමිණි බව අරාබි මූලාශ්‍ර පෙන්වා දේ.
- ➢ මක්‍රාන් කපොල්ල ඉතා දුෂ්කර කපොල්ලක් වූ අතර ඇලෙක්සැන්ඩර් ආපසු සිය රට බලා යාමේදී මෙම කපොල්ල භාවිත කළ බව ග්‍රීක වාර්තා පෙන්වා දේ.

**(ලකුණු 08 යි )**

(ii) ඉන්දියාවෙන් බාහිර ලෝකයට සිදු වූ බලපෑම (ලකුණු 08 යි)

- ඉන්දියාව බටහිර ලෝකය හා මධ්‍ය ආසියාව සමග සබඳතා ගොඩනගා ගනු ලැබුවේ මෙම කපොලු හරහාය. උදා: චන්ද්‍රගුප්ත මෞර්ය රජු නිකේටර් සමග ඇතිකර ගත් ගිවිසුමට අනුව ඉන්දියාවෙන් පිටත ප්‍රදේශයට පවා මෞර්ය බලය ව්‍යාප්ත වීම.
- ගුප්ත රජ පෙළපතේ දෙවන චන්ද්‍රගුප්ත රජතුමාද ඉන්දියාවෙන් බැහැරට ආක්‍රමණයක් එල්ල කළ බවට වාර්තාවී තිබේ.
- ඊට පෙර අසෝක අධිරජුගේ ධර්මදූත ව්‍යාපාරය මගින් ඉන්දියාවෙන් පිටත මධ්‍ය ආසියාව තෙක් බුදුදහම ව්‍යාප්තවීම.
- කුෂාණයින් යටතේ මධ්‍ය ආසියාව හරහා චීනය තෙක් බෞද්ධාගම, සංස්කෘතිය, කලාව හා ගෘහනිර්මාණ ශිල්පය වැනි දෑ පිළිබඳ සම්බන්ධතා ඇතිවීම
- මධ්‍ය ආසියාවේ බෞද්ධ මධ්‍යස්ථාන ආරම්භ වීම.
- මෙලෙස ඉන්දියානු දේශපාලන ආධිපත්‍ය මෙන්ම ආගම්, සංස්කෘතිය හා දර්ශනය ඉන්දියාවෙන් බැහැරට ව්‍යාප්ත වීම.
- වෙළෙඳුන් මෙම කපොලු ඔස්සේ ගමන් කරමින් ඉන්දීය නිෂ්පාදන වෙනත් රාජ්‍යයනට හුරුකරවීම - චීනය, මධ්‍ය ආසියාව, පර්සියාව, ග්‍රීසිය, අරාබිය ඉන් ප්‍රධාන වීම.
- ඉන්දීය භාෂා වෙනත් රාජ්‍ය වෙත ව්‍යාප්ත වීම.
- ඉන්දීය කලා සම්ප්‍රදායන් මධ්‍ය ආසියානු රාජ්‍යවලට ව්‍යාප්තවීම.
- තානාපති සබඳතා තහවුරුවීම.
- ඉන්දීය අධ්‍යාපන ක්‍රමවේද ආසියාව පුරා ව්‍යාප්ත වීම.

(ලකුණු 08 යි)

**3.** ක්‍රි.පූ. 6 වන සියවසේ උතුරු ඉන්දියාවේ පැවති දේශපාලන හා ආගමික තත්ත්වය පරීක්ෂා කරන්න. (ලකුණු 16 යි)

- බෞද්ධ හා ජෛන ග්‍රන්ථවල මේ අවධියේ පැවති දේශපාලන හා ආගමික තත්ත්වය පිළිබඳව තොරතුරු සඳහන්ව ඇත .
- සොළොස් මහා ජනපද - අංග, මගධ, කාසි, කෝසල, වජ්ජි, මල්ල, චේදි වත්ස, මත්ස්‍ය, කුරු, පංචාල, සූරසේන, අස්මක, අවන්ති, ගන්ධාර, කාම්බෝජ.
- සොළොස් මහා ජනපද අතරින් මගධ, කෝසල, වත්ස, අවන්ති ප්‍රධාන රාජාණ්ඩු ලෙස වර්ධනයවී ඇත.
- මෙම ජනපද එකිනෙකා අභිබවා යාමට උත්සාහ දැරීම මේ යුගයේ දක්නට ලැබුණු ලක්ෂණයකි.
- රාජාණ්ඩු හා සමූහාණ්ඩු පාලනය ජනපදවල වර්ධනය වීම.
- තනි පුද්ගලයකු රාජාණ්ඩුවක පාලකයා වූ අතර ඔහු ඉතා බලවත් අයෙකු වීම.
- රජුගේ බලය සීමා කිරීමට මන්ත්‍රී පර්ෂද් පාලන සංවිධානයට එකතුවීම.
- පුරෝහිත හා සේනාපති යනාදි වශයෙන් නිලධාරී කණ්ඩායමක් පාලනයට සම්බන්ධ වීම.
- චතුරංගනී සේනාවක් (ඇත්, අස්, රිය, පාබල) යොදවා රාජ්‍යය ආරක්ෂා කිරීම.
- රාජාණ්ඩු පාලනය තුළ මත්ස්‍ය න්‍යාය අනුගමනය කිරීම.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- විවාහ සබඳතා ඔස්සේ විවිධ රාජ්‍යයන් සමඟ දේශපාලනය සබඳතා ඇතිකර ගැනීම මෙන්ම තම පාර්ශවයට ඔවුන් අවනත කර ගැනීම.
- වජ්ජි, මල්ල, කුරු වැනි ජනපදවල සමූහාණ්ඩු පාලනය හෙවත් සණතන්ත්‍ර පාලනයක් ක්‍රියාත්මක වීම.
- සමූහ පාලනය තුළ පාලන ව්‍යවස්ථාව ලෙස සප්ත අපරිහානීය ධර්ම අනුගමනය කිරීම.
- වජ්ජි හා කුරු වැනි සමූහාණ්ඩුවලට අමතරව සණ රාජ්‍ය නවයක් දක්නට ලැබීම.
    1. කපිලවස්තුවේ - ශාක්‍යවරු
    2. පාවා හා කුසිනාරාහි - මල්ලවරු
    3. වෛශාලියේ - ලිච්ඡවීන්
    4. රාමගාමයේ - කෝලියවරු
    5. අල්ලකප්පයේ - බූලිවරු (බුල්ලිවරු)
    6. කේසපුත්තයේ - කාළාමවරු
    7. පිප්ඵලීවනයේ - මෝරියවරු
    8. සුංසුමාරගිරියේ - බග්ගයන්
    9. මිථිලාවේ - විදේහවරු
- මේවායේ පාලකයන් ගණපති ගණ ජ්‍යෙෂ්ඨ ලෙස හැඳින්වීම.
- විධායක සභාවක් පාලනයට සහාය වීම.
- අධිකරණ කටයුතු ප්‍රවේණි පුස්තකයට අනුව සිදුකිරීම.
- සන්ථාගාර ශාලාව තුළ පරිපාලන කටයුතු සාකච්ඡා කිරීම.
- බෞද්ධ සාහිත්‍යයේ ලිච්ඡවී රජවරු 7707ක් සිටි බව සඳහන් කරයි.

ආගමික තත්ත්වය.

- ක්‍රි. පූ. 6වන සියවස වන විට බ්‍රාහ්මණ සම්ප්‍රදාය ඉක්මවා ගිය ආගමික හා දාර්ශනික චින්තාවන් රැසක් ඉස්මතු වීම.
- බුදුන් වහන්සේගේ පහළවීම හා බුදු දහම ඉන්දියාවේ බොහෝ ප්‍රදේශවල ව්‍යාප්තවීම
- බුදු දහම හා ජෛන දහම වඩාත් කැපී පෙනෙන ආගම් බවට පත්වීම.
- මෙකල විවිධ ආගමික දෘෂ්ටීන් 62ක් පමණ පැවති බවට තොරතුරු හමු වීම
- ජෛන ආගම බ්‍රාහ්මණ ඉගැන්වීම්වලට මුළුමනින් පටහැනිව රාජකීය අනුග්‍රහයද ලබාගෙන පුළුල් ව්‍යාප්තියක් ඇති වීම.
- බුදුදහම කෙරෙහි ලැබුණු ජන ප්‍රසාදය හා රාජ්‍ය අනුග්‍රහය නිසා කෙටි කලකින් එය විශාල ප්‍රදේශයක ව්‍යාප්තවී ඉන්දියාවේ ප්‍රධාන ආගමක් බවට පත්වීම.
- ෂඩ්ශාස්තෘවරු ලෙස ප්‍රසිද්ධියට පත් ශාස්තෘවරුන්ගේ දර්ශන කැපී පෙනේ.
    1. පූර්ණකාශ්‍යප - අකිරියවාදය.
    2. මක්ඛලීගෝශාල -නියතිවාදය හෙවත් නාස්තිකවාදය.
    3. අජිත කේසකම්බල - උච්ඡේදවාදය
    4. පකුධ කච්චායන - ශාස්වතවාදය
    5. සංජය බෙල්ලට්ඨිපුත්ත -අමරාවික්ඛේප වාදය.
    6. නිගන්ඨනාථපුත්ත -අවිහිංසාවාදය.
- ආජීවක හා පරිබ්‍රාජක පිරිසක් මෙකළ ආගමික වශයෙන් කටයුතු කිරීම.

(ලකුණු 16 යි )

4. "මෞර්ය අධිරාජ්‍යය බිඳවැටීම සිදු වූයේ අසෝක රජුගේ ප්‍රතිපත්තිවලට දැක්වූ බ්‍රාහ්මණ විරෝධය නිසා ය."

(i) මෞර්ය අධිරාජ්‍යයේ අගනුවර නම් කරන්න. (ලකුණු 01 යි)

පාටලීපුත්‍රය /පැළලුප් නුවර.

(ii) මෞර්ය රාජධානියේ පළමුවන හා දෙවන පාලකයන් පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02 යි)

1. මෞර්ය චන්ද්‍රගුප්ත
2. බින්දුසාර (සිංහසේන, අමිත්‍රෝචතෙස්, අමිත්‍රඝාත )

(iii) අවසාන මෞර්ය පාලකයාගෙන් රජකම පැහැරගත් සේනාපතිගේ නම කුමක් ද? (ලකුණු 01 යි)

පුෂ්‍යමිත්‍ර ශුංග

(iv) බ්‍රාහ්මණ විරෝධය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් මෞර්ය අධිරාජ්‍යය බිඳවැටීමට හේතු වූ සාධක සාකච්ඡා කරන්න. (ලකුණු 12 යි)

මෞර්ය අධිරාජ්‍යය බිඳ වැටීමට බලපෑ කරුණු ගණනාවක්ම සොයා ගත හැකි වේ.

- මේ සඳහා බලපෑ ප්‍රධානතම කරුණ ලෙස හරිප්‍රසාද් ශාස්ත්‍රී පෙන්වා දෙන්නේ බ්‍රාහ්මණ විරෝධයයි.
- මෞර්ය අධිරාජ්‍යයේ විසූ අශෝක රජු විසින් ගෙන ගිය ක්‍රියාමාර්ග මේ සඳහා බලපා තිබේ.
  1. යාගය පිණිස සත්ව ඝාතනය තහනම් කිරීම. සියලු රටවැසියා මාගේ දරුවෝය යනුවෙන් ප්‍රකාශ කොට වර්ණ ක්‍රමය නොසලකා හැරීම
  2. ධර්ම මහාමාත්‍රවරුන් පත්කිරීම හා අධිකරණ පද්ධතියේ ඇති කළ සම නීතිය නිසා බමුණන්ගේ පිළිගැනීම අඩුවී යාම.
  3. අවිහිංසාවාදී පිළිවෙත.
  4. බුදුදහමට විශේෂ සැලකිල්ලක් දැක්වීම නිසා බ්‍රාහ්මණ ආගම යටපත් වීම.
  5. බුදුදහම වෙනුවෙන් විශාල ධනයක් වැය කිරීම නිසා අර්බුදයකට ලක් වීම.
- පුෂ්‍යමිත්‍ර සුංග බෘහත්රථ මරණයට පත් කිරීම බ්‍රාහ්මණ බලයේ කුමන්ත්‍රණයක් ලෙසට සැලකිම.
- අසෝක රජුගෙන් පසු රාජ්‍යත්වය සම්බන්ධයෙන් ඇතිවූ කුමන්ත්‍රණ හේතුවෙන් මතුව වූ අභ්‍යන්තර

අර්බුද හා ප්‍රාදේශීය පාලකයන් ස්වාධීන වීමද මෙම පරිහානියට හේතුවිය (කාශ්මීර, ගාන්ධාර හා කාලිංග ප්‍රාන්ත)

- අසෝකගෙන් පසුව දුර්වල පාලකයන් බලයට පත්වීම නිසා විශාල අධිරාජ්‍යයක් පාලන කිරීමට අසමත් වීම (වසර 50ක් තුළ පාලකයින් 6 දෙනෙකු සිටියේය)
- වයඹ දිගින් ක්‍රි. පූ. 187දී පමණ එල්ලවූ ඩිමිට්‍රියස්ගේ බැක්ට්‍රියානු ග්‍රීක ආක්‍රමණ මෙම බිඳ වැටීම වේගවත් කිරීම.
- අධිරාජ්‍යයේ විශාලත්වය නිසා නඩත්තුව අපහසුවීම.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- සිංහාසනය රැකගැනීමට අසමත් පාලකයින් බලයට පත්වීමද මේ බිඳවැටීමට හේතු වීම (පරිපාලන සංවිධානයේ දුර්වලතා).
- එහෙත් ඇතැමුන් මේ පරිහානියට අසෝක අධිරජුගේ ප්‍රතිපත්තිය හේතු වූ බවත් ඔහුගේ ආගමික ප්‍රතිපත්තිය හේතු කොට ගෙන යුද හමුදාව දුර්වලවීම හා රටේ එක්සත් භාවය බිඳවැටීම මගින් මෙසේ සිදු වූ බවත් කියා තිබේ.
- එහෙත් තාපර් වැනි උගතුන් ආර්ථිකය දුර්වලවීම හේතු කොට ගෙන විශාල හමුදාවක් නඩත්තු කිරීමට නොහැකිවීම වැනි හේතු ඊට බලපා ඇතැයි විශ්වාස කොට තිබේ.

**(ලකුණු 12 යි)**

**5.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑ ම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ බිඳවැටීම
(ii) පශ්චාත් වෛදික යුගයේ සමාජය
(iii) මෙගස්තිනිස්
(iv) සංගම් සාහිත්‍යය

(ලකුණු 08 × 2 = 16 යි)

**(I). ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ බිඳ වැටීම.**

- ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ බිඳවැටීම පිළිබඳව විවිධ මත ඉදිරිපත්වී ඇත.
- ජලගැලීම් නිසා විනාශයට පත් වූ බව. ඉන්දු නදිය දෙපස විශාල ප්‍රාකාර තැනීම, ස්ථර අතර රොන්මඩ තැන්පත්වීම, රාවි ගඟේ ගමන් මාර්ගය වෙනස්වීම, මේ සම්බන්ධයෙන් ඒ. වී. ෂර්මා, මෝටිමර් වීලර්, ජෝන් මාර්ෂල් අදහස් දක්වා ඇත.
- ප්‍රධාන නගර දෙකෙන් පස් ස්ථර හමුවීම. මොහෙන්ජෝදාරාවෙන් 9යි. හරප්පාවෙන් 6යි. (රොන් මඩ).
- සතුරු ආක්‍රමණයකින් විනාශ වූ බව, ප්‍රහාරයකින් මියගිය බව සැලකිය හැකි පුද්ගලයන්ගේ ඇටසැකිලි හමුවීම. (නිවෙස් තුළ හා මාර්ගවල)
- සමූහ ඇටසැකිලි ස්ථාන කිහිපයකින් හමුවීම. ඍග්වේදයේ සඳහන් වන ආර්යයන් ජයගත් බලකොටු හෙවත් පුර පිළිබඳ විස්තර.
- ආර්යයන් සමග සටන් පැවති හරියූපියා නගරය පිළිබඳව සඳහන් වීම. මේ පිළිබඳ තොරතුරු ඒ. එල්. බෂාම් හා ජෝන් මාර්ෂල් පෙන්වා දෙයි.
- ක්‍රමිකව පරිහානියට පත්වීම. ජනගහණය වර්ධනය වීම සමඟ ජීවන තත්ත්වය පහළ යාම නිසා ක්‍රමයෙන් පිරිහුණු බව. අවසාන කාලයේ පරිහානීය ලක්ෂණ පැවතීම (පැරණි ගඩොල් භාවිතයට ගැනීම, මාර්ග වැසෙන පරිදි ගොඩනැගිලි ඉදිවීම).
- දේශගුණික වෙනස්වීම මගින් පරිසරයේ සමතුලිත බව බිඳීයාම, අධික දර භාවිතය නිසා වනාන්තර විනාශවීම, ගංගාවල ගමන් මාර්ග වෙනස්වීම යන කරුණු අර්නස්ට් මැකේ පෙන්වා දෙයි.
- ලෙඩ රෝග හා වසංගත රෝග පැතිරීයාම - පරිසරයේ වෙනස්වීම මෙන්ම ජල ගැලීම් නිසා වසංගත රෝග පැතිර යාම මේ ප්‍රදේශ අතහැර යාමට බලපාන්නට ඇති බව.
- හදිසි ගින්නකින් ශිෂ්ටාචාරය බිඳ වැටුණු බව.
- සැමුවෙල් බට්ලර් පෙන්වා දෙන්නේ සියවස් ගණනාවක් තිස්සේ ඒකාකාරී පැවැත්මට හුරු පුරුදුවී සිටි ඉන්දු නිම්න වාසීන් කිසියම් හදිසි අවස්ථාවක් හේතු කොට ගෙන සසලවීම හා නොසන්සුන්තාවයකින් බිඳ වැටෙන්නට ඇති බවයි.

**(ලකුණු 08 යි)**

(II). **පශ්චාත් වෛදික යුගයේ සමාජය.**

- සප්ත සින්ධු ප්‍රදේශයේ විසූ ජනයා නැගෙනහිර නිම්නයට සංක්‍රමණය වීම මේ සමයේ ප්‍රධාන වෙනස වේ.
- ගෝත්‍රික සමාජය තවදුරටත් ස්ථාවර වීම දක්නට ලැබීම.
- ඍග් වේදයේ දහවන මණ්ඩලයේ පුරුෂ සූක්තයෙන් චතුර්වර්ණ ක්‍රමයේ ආරම්භය පිළිබඳ අදහස් ඉදිරිපත් වීම.
- බ්‍රාහ්මණ ආධිපත්‍යය සමාජයේ මුල් බැස ගැනීම.
- කුල අනුව රැකියාව තීරණය වීම. ක්ෂත්‍රියයන්ට රාජ්‍ය පාලනය, වෛශ්‍යයන්ට වෙළඳාම හා ගොවිතැන, ශුද්‍රයන්ට ඉහළ වර්ණවලට සේවය කිරීම.
- ප්‍රධාන කුල හැරුණු කොට නිසා නේෂාද නම් කුලයක් පැවතීම හා එහි තවත් කොටස් දක්නට ලැබීම. - ව්‍රත, පංජිෂ්ඨ, ගවානිස්, මෘගායු, තක්ෂාන්, රථකාර, කුළාල, කර්ථාර.
- මෙකල සමාජයේ වර්ණාශ්‍රම ධර්ම දක්නට ලැබීම. - බ්‍රහ්මචාරී, ගෘහස්ථ, වානප්‍රස්ථ, සන්‍යාසී.
- වර්ණාශ්‍රම ධර්ම අනුව ජීවිතයේ විවිධ අවස්ථාවලදී සිදු කළ සංස්කාර විධි රැසක් සඳහන් වේ.
- කාන්තා නිදහස අහිමි වීම.
- ඒකභාර්යා සේවනය හා බහුභාර්යා සේවනය දක්නට ලැබීම.
- වැන්දඹු කාන්තාවකට නැවත විවාහ වීමට තිබූ නිදහස අහිමිවී තිබුණද එය තදින් ක්‍රියාත්මක නොවිණි.
- ඇඳුම් පැළඳුම් ඍග් වෛදික යුගයට සමානව පැවතුණි.
- සෝම පානය වඩාත් බහුල වූ අතර ආහාර රටාව පෙර සේම පැවතුණි.
- විනෝදාංශ ලෙස ගායනය, වාදනය, නර්තනය, දූකෙළිය රිය ධාවනය පැවතියේය.

**(ලකුණු 08 යි )**

(III). **මෙගස්තිනිස්**

- මොහු ග්‍රීක ජාතිකයෙකි.
- සෙලියුකස් නිකේටර් විසින් තම සම්බන්ධතාවන් සඳහා මෞර්ය චන්ද්‍රගුප්ත රජුගේ රාජ සභාවට එවූ තානාපති.
- පාඨලීපුත්‍ර නගරයේ සිය දීර්ඝකාලීන අත්දැකීම් ඇතුළත් කොට **ඉන්ඩිකා** කෘතිය රචනා කිරීම.
- ඉන්දියාවේ සමාජ පන්ති 7ක් පිළිබඳ විස්තර සඳහන් කර තිබේ.
- පාඨලීපුත්‍ර නගරය පාලනය කිරීම සඳහා 05දෙනා බැගින් යුත් මණ්ඩල 6ක් සිටි බව පෙන්වා දෙයි.
- මෞර්ය චතුරංගනී සේනාව හා එහි සංඛ්‍යාත්මක පිරිස් පිළිබඳව සඳහන් කර තිබේ.
- මෞර්ය හමුදා සේනාංකය සාමාජිකයන් 30කින් යුත් සභාවක් මගින් පාලනය වූ බව පෙන්වා දෙන අතර මෙයද 5 දෙනෙකුගෙන් යුක්ත මණ්ඩල 6කින් සමන්විත බව සඳහන් කර ඇත. (නාවික, අශ්ව, ඇත්, රථ, ප්‍රවාහක හා ආහාර, පාබල).
- මෞර්ය දඬුවම් ඉතා දරුණු බව සඳහන් කර ඇත. අංගඡේදනය හා මරණ දඬුවම ක්‍රියාත්මක වූ බව පෙන්වා දෙයි.
- අයබදු එකතු කිරීම ඉතා විධිමත් ලෙස ක්‍රියාත්මක වූ බව දක්වා ඇත.
- අධ්‍යාපනය විධිමත්ව පැවැති බව සඳහන් කරයි.
- රන් කර්මාන්තයද පැවති බව දක්වා ඇත.
- ඉදිරිපත් කර ඇති සමහර තොරතුරු විශ්වසනීයත්වයෙන් තොර බවට විද්වතුන් අදහස් දක්වයි.

**(ලකුණු 08 යි)**

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(IV). **සංගම් සාහිත්‍යය**

- ක්‍රි.ව. පළමුවැනි සියවසේ සිට ක්‍රි.ව. තුන්වැනි සියවස දක්වා කාල පරිච්ඡේදය තුළ පාණ්ඩ්‍ය රජවරුන්ගේ අනුග්‍රහයෙන් ඒකරාශී වූ සංගම් මගින් රචිත සාහිත්‍ය සංගම් සාහිත්‍ය වේ.
- එවැනි සංගම් තුනක් පවත්වා තිබේ
- සංගම් සාහිත්‍යය උපදේශාත්මක හා වෘත්තාන්තමය යනුවෙන් ද්වවර්ගයකි. (කීල්කනක්කු, මේල් කනක්කු).
- පළමු සංගමයට අයත් ග්‍රන්ථ සොයා ගෙන නැත.
- දැනට හමුවන පළමුවන කෘතිය වන්නේ දෙවන සංගමයේ රචිත තෝල්කාප්පියම් නැමැති ව්‍යාකරණ ග්‍රන්ථයයි.
- තුන්වන සංගමයේදී රචිත ප්‍රධාන ග්‍රන්ථ දෙකකි.
- සංහිතා (කාණ්ඩ) අටකින් සමන්විත වූ එට්ටුත්තොගයි හා ගීත (කාණ්ඩ) දහයකින් සමන්විතවූ පත්තුප්පාට්ටුය.
- එට්ටුත්තොගයි ග්‍රන්ථ: අගනානූරු, පුරනානූරු, නට්රිණයිනානූරු, කුරුන්තෝගයිනානූරු, අයිංගුරුනූරු, පදිට්ටුප්පත්තු, පරිපාඩල්, කලිත්තොගයි)
- පත්තුප්පාට්ටු- (තිරුමුගාට්ටුප්පඩෛ, පොරුනාට්ටුප්පඩෛ, සිරුපානාට්ටුප්පඩෛ, පෙරුම්පානාට්ටුප්පඩෛ, මුල්ලයිප්පාට්ටු, මධුරයික්කාම්, නෙඩුනල්වාඩෛ, කුරුන්ජිප්පාට්ටු, පට්ටනප්පාඩෛල්, මලයිපඩුකඩාම්.
- පළමු සංගමයේ කවියා අගත්තියර් මුනිවරයාය. ඊට අමතරව මුරංජියුර්, මුඩිනාගායර් යන කවීන්ද දක්නට ලැබේ.
- දෙවන සංගමයේ කවීන් ලෙස තොල්කාප්පියර්, වල්ලුක්කාප්පියර් වැදගත්වේ.
- තුන්වන සංගමයේ කවීන් ලෙස කඩිලර්, පරකර්, නක්බරාර්ය.
- සංගම් සාහිත්‍යයෙන් දේශපාලන තොරතුරු සේම ආගමික පසුබිම, වෙළදාම හා එකල පැවති වෙළඳ ද්‍රව්‍යය, සමාජ හා සංස්කෘතිය පිළිබඳව තොරතුරු සොයා ගත හැකි වේ.
- දකුණු ඉන්දියාවේ පැවති චේර, චෝළ, පාණ්ඩ්‍යය යන රාජ්‍යයන් පිළිබඳව තොරතුරු සොයා ගත හැකිවේ. මෙම රාජ්‍යවල සිටි කරිකාලන්, සෙන්ගුට්ටුවන්, නෙඩුඤ්ජේලියන් යන රජවරුන් පිළිබඳ තොරතුරු සොයා ගැනීමට හැකියාව ඇත.
- රජවරුන් එවකට සිටි කවීන්ට රාජකීය අනුග්‍රහය ලබාදුන් බව සඳහන් කරන අතර කවීන් 500ක් පමණ සිටි බවට තොරතුරු හමුවේ. කවීන් අතර කාන්තාවන්ද සිටි බවට තොරතුරු ඇත.
- පරිසරයට සමීප වෙමින් එකල ජනයා තම ජීවිතය පවත්වා ගෙන ගිය බවට තොරතුරු හමුවේ.

**(ලකුණු 08 යි)**

## C කොටස

6. ඉන්දියාවේ දේශපාලන හා සංස්කෘතික වර්ධනය කෙරෙහි කුෂාණයන්ගේ දායකත්වය විචාරාත්මක ව පරීක්ෂා කරන්න. (ලකුණු 16 යි)

### දේශපාලන වර්ධනය

- මෞර්ය රාජවංශය බිඳවැටීමෙන් පසුව උතුරු ඉන්දියාවේත් මධ්‍ය ආසියාතික ප්‍රදේශවලත් බලය පිහිටු වූයේ කුෂාණ රාජ වංශයයි.
- කුෂාණ රජවරු අතර කුජුලකැඩ්පයිසීස්, විමාකැඩ්පයිසීස්, කණිෂ්ක, වශිෂ්ක, හුවිෂ්ක වාසුදේව යන රජවරු ප්‍රධාන වේ.
- කුෂාණ රජවරුන්ගේ නිජභූමිය වන්නේ චීන තුර්කිස්ථාන් ප්‍රදේශයයි. මොවුන් යූ-ඒ-චි නම් ගෝත්‍රික කණ්ඩායමකට අයත්ය. ක්‍රි.පූ.140 -120 අතර කාලයේ සේද මාවත ඔස්සේ මධ්‍ය ආසියාවට හා වයඹ දිග ඉන්දීය ප්‍රදේශවලට මොවුන් ව්‍යාප්තවී ගියේය.
- කුෂාණ රාජ වංශයේ ආදිතම පාලකයා වන්නේ කුජුලකැඩ්පයිසීස්ය. වයඹදිග ඉන්දියාවෙන් හමුවන ඛරෝෂ්ඨී අක්ෂරවලින් රචිත පැරණි ලේඛනවලින් ඔහුගේ බලය ඈත වයඹදිගට සීමාවී තිබූ බව කියයි.
- කුජුලකැඩ්පයිසීස්ට පසුව කුෂාණ රාජවංශයේ පාලකයා වූයේ ඔහුගේ පුත් විමකැඩ්පයිසීස්ය. මොහුගේ පාලන කාලය තුළ වයඹදිග ඉන්දියාවේ සැලකිය යුතු ප්‍රදේශයක හා පංජාබ්, තක්ෂිලා හා මථුරා ප්‍රදේශ දක්වාම දේශපාලන බල ව්‍යාප්තිය සිදුව ඇති බවට පුරාවිද්‍යාත්මක සාධක ඇත.
- විමකැඩ්පයිසීස් නිකුත්කොට ඇති කාසිවල සර්වලෝක ඊශ්වර, මහේෂ්වර යන නාමයන් සටහන් කොට ඇති බැවින් ඔහුගේ දේශපාලන බලයේ ශක්තිය ප්‍රකාශ වෙයි. ග්‍රීක හා රෝම ප්‍රදේශ සමඟද මොහු දේශපාලන හා ආර්ථික සම්බන්ධතා පවත්වා තිබේ.
- කුෂාණ රාජවංශයේ විශිෂ්ඨතම පාලකයා වන්නේ කණිෂ්ක රජුය. ක්‍රි. ව.78දී වයඹදිග ඉන්දියාවේ පෙෂාවෝර් (පුරුෂපුරය) පාලන මධ්‍යස්ථානය කොටගෙන අධිරාජ්‍යයක් බිහිකළේය.
- සාරානාත් හා ශ්‍රාවස්ති අභිලේඛන මගින් කණිෂ්ක රජු උතුරු ඉන්දියාවේ නැගෙනහිර ප්‍රදේශයේ බලය ව්‍යාප්ත කොට තිබූ ආකාරය තහවුරු කරයි.
- උතුරු සින්ද්, රාජ්පුතානා හා මාල්වා දක්වා කණිෂ්ක බලය ව්‍යාප්තවී තිබූ බව සාංචි සෙල්ලිපිය හා අනෙකුත් මූලාශ්‍ර පෙන්වා දේ. කාශ්මීරයේද කනිෂ්කගේ බලය ව්‍යාප්තව තිබූ බවට කාශ්මීර වංශකතාව වන රාජතරංගණිය සාධක සපයයි. හියුං සියෑං වාර්තාවද මේ බව සනාථ කරයි.
- ටිබෙට් හා චීන මූලාශ්‍රත්, කුමාරලතාගේ කල්පනාමණ්ඩිටිකාවත් පෙන්වා දෙන්නේ සාකේත හා පාඨලීපුත්‍ර පාලකයින් සමග සටන් වැදුණු කණිෂ්ක එම ප්‍රදේශවලද දේශපාලන බලය පිහිටවූ බවයි.
- අල්බිරූනි වාර්තා කරන ආකාරයට කනිෂ්ක රජුගේ පාලන බලය ඇෆ්ගනිස්ථානය හා මධ්‍ය ආසියාව දක්වා ව්‍යාප්තවී ඇත.
- හියුං සියෑං හිමියන්ගේ වාර්තාවලට අනුව චීනයේ සුංලිං කඳුවැටිය හා හොවැංහෝ නිම්නය දක්වාම කනිෂ්ක රජුගේ දේශපාලන බලය වර්ධනයවී තිබිණි.
- පෙරිප්ලස් ග්‍රන්ථයට අනුව බටහිර ඉන්දියාවේ සැලකිය යුතු ප්‍රදේශයකද පාලන බලය කණිෂ්ක අධිරාජයාගේ පාලනයට නතුව තිබී ඇත.
- කනිෂ්ක රජු ගෙන් පසුව පාලන බලයට පත්ව ඇත්තේ වාශිෂ්ක රජුය. ඔහු "මහරජ, රජති රජ, දේවපුත්‍ර, වශිෂ්ක" යන නාමය සහිත අභිලේඛන උතුරු ඉන්දියාවට පමණක් සීමාවී තිබීමෙන් වශිෂ්ක රජු යටතේ කුෂාණ අධිරාජ්‍යයේ බලය පිරිහී ගිය බවක් පෙන්නුම් කරයි.
- වශිෂ්ක රජුගෙන් පසුව බලයට පත්වූ හුවිෂ්ක රජු කුෂාණ රාජවංශයේ වැදගත් අවසන් පාලකයාය.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- හුවිෂ්ක රජුගෙන් පසු වාසුදේව රාජ්‍යත්වයට පත්ව ඇති අතර ඔහු නිකුත් කළ කාසි මථුරාවට සීමාවී තිබීමෙන් කුෂාණ රාජවංශයේ බල පිරිහීම පෙනී යයි.
- ක්‍රි.ව. තුන්වන ශතවර්ෂයේ දෙවන භාගය වන විට කුෂාණ රාජ්‍යයට නතුව තිබූ බලප්‍රදේශ ඔවුන්ගෙන් ගිලිහී ගිය අතර වැඩි කොටසක් පර්සියාවේ සසේනියන් රාජවංශයේ බලයටත් ඉතිරි කොටස මථුරාවේ නාග ගෝත්‍රිකයින්ගේ බලයටත් නතුවීමෙන් කුෂාණවරුන්ගේ බලය පිරිහී ගොස් තිබේ.

**සංස්කෘතික වර්ධනය**

- ඉන්දීය ඉතිහාසයේ සම්මිශ්‍රිත සංස්කෘතික වර්ධනයක් පෙන්නුම් කරන්නේ කුෂාණ රජවරුන් යටතේය. මේ අතරට චීන සංස්කෘතික ලක්ෂණ මෙන්ම ග්‍රීක බැක්ටීරියානු සංස්කෘතික ලක්ෂණද මිශ්‍රවී තිබේ. කුෂාණ රජවරුන්ගේ ආර්ථික වර්ධනය මෙම සංස්කෘතික වර්ධනය සඳහා මූලික අඩිතාලම දමා ඇත.
- කුජුලකැඩ්පයිසීස් හා විමකැඩ්පයිසීස් යටතේ කාසි නිකුත් කොට ඇති අතර ඒ මගින් ඔවුන්ගේ නව සංස්කෘතික ප්‍රවේශය පිළිබිඹුවේ. නමුත් මොවුන් යටතේ විශාල සංස්කෘතික ප්‍රබෝධයක් හඳුනාගත නොහැකිය.
- මහායාන බෞද්ධ දර්ශනයේ ආභාසය ලැබූ කණිෂ්ක, වශිෂ්ක හා හුවිෂ්ක යන රජවරු යටතේ විශාල සංස්කෘතික ප්‍රබෝධයක් දැකිය හැකි අතර ඒ අතරින්ද මුල් කාලයේ දේව භක්තිකයෙකුව සිට පසුව මහායාන බෞද්ධයකු වූ කණිෂ්ක රාජ්‍ය කාලයේ සංස්කෘතික ප්‍රබෝධය ප්‍රමුඛවේ.
- ක්‍රි.ව. පස්වන සියවසේ කාශ්මීරයේ සංචාරය කළ හියුං සියැං හිමියන්ගේ දේශාටන වාර්තාවේ දැක්වෙන්නේ කණිෂ්ක රජු කාශ්මීරයේ මහල් ගණනාවකින් යුත් ධාතු මන්දිරයක් හා බුද්ධ ප්‍රතිමාවක් කරවූ බවයි. එසේම කපිස නම් ස්ථානයේ කළ ස්තූපයක් හා ධාතු මන්දිරයක් පිළිබඳවද එහි සඳහන් වේ. මේ ධාතු මන්දිරය අගසිලවුස් නම් ග්‍රීක ගෘහනිර්මාණ ශිල්පියා කරවූ බව ග්‍රීක වාර්තාවල දැක්වේ.
- පළමුවන මහායාන සංගායනාවේ ප්‍රධාන අනුග්‍රාහකයා කණිෂ්ක රජු බව මහායාන මූලාශ්‍ර තොරතුරු සපයයි. මේ සඳහා රජුට උපදෙස් ලබාදී ඇත්තේ අශ්වඝෝෂ හිමියන්ය. කාශ්මීරයේ කුණ්ඩලවන විහාරයේ පැවති මෙහි ප්‍රධානත්වය දරා ඇත්තේ වසුමිත්‍ර හිමියන්ය, ආර්යදේව සංඝරක්ඛිත, සූරියබන්දු, ජිනබන්දු යන හිමිවරුන්ද ඒ සඳහා සහයෝගය ලබා දී ඇත.
- කණිෂ්ක ධර්ම සංගායනාවේදී ථේරවාදී ත්‍රිපිටකයේ කරුණු බ්‍රාහ්මණ ඉගැන්වීම් හා එක්කොට මහා විභාෂා නමින් අටුවාවක් හඳුන්වා දී තිබේ. මෙය මහාසූත්‍ර විභාෂා, විනය විභාෂා සහ අභිධර්ම විභාෂා නමින්ද හඳුන්වා ඇත.
- සෑම දෙනාටම බුද්ධත්වය ලැබිය හැකිය යන මහා ප්‍රඥා පාරමිතා සූත්‍රාන්තර ඉගැන්වීමට අනුව සෑම බෞද්ධයෙක්ම බෝධිසත්ව ධර්ම පූර්ණය කළේය. මේ හේතුවෙන් භාරතීය සංස්කෘතිය ලෝකෝත්තර අරමුණක් කරා හැඩ ගැසිණි.
- ග්‍රීක බැක්ටීරියානු ආභාසය සහිතව බුද්ධ ප්‍රතිමා හා බෝධිසත්ව ප්‍රතිමා නිර්මාණය මෙකල ආරම්භ විය. මෙයට අමතරව මිත්‍ර, ශිව, නාග වැනි දෙවිවරුන්ගේ දේව රූපද හමුවී තිබේ. බුද්ධ රූප අතර මථුරා සම්ප්‍රදායට අයත් සාරානාත් ප්‍රතිමාවට මුල් තැනක් ලැබේ.
- ඉන්දියාවෙන් පිටත අග්නිදිග හා නැගෙනහිර ආසියාවට මහායාන බෞද්ධ දර්ශනය ව්‍යාප්තව ගියේද කුෂාණ රජවරුන් යටතේය. මහායාන බෞද්ධ ග්‍රන්ථ චීන භාෂාවට පරිවර්තනය කොට ඇත්තේ මෙම කාල වකවානුවේදීය.
- හුවිෂ්ක රජු යටතේ හුවිෂ්ක පුරයේ ආරාමවල බෞද්ධ භික්ෂූන් වහන්සේලා 5000ක ප්‍රමාණයක් වැඩ වාසය කළ බව මූලාශ්‍ර දක්වයි. මේ මගින් එවකට සංස්කෘතික ප්‍රබෝධයට ලැබුණු භික්ෂු දායකත්වය පැහැදිලිය.

- මෙකල සාහිත්‍ය දියුණුවක්ද පැවතුණි. බුද්ධචරිත, මහකාව්‍ය, සූත්‍රාලංකාරය, ශාරිපුත්‍රප්‍රකරණය, සෞන්දරානන්ද මහා කාව්‍ය, දශභූමි, සුහෘත්ලේඛා, ශූන්‍යවාදය, නිකාය සිද්ධාන්ත, චරක සංහිතා වැනි ලෞකික හා ලෝකෝත්තර ග්‍රන්ථද මෙම සාහිත්‍ය ග්‍රන්ථ අතර ප්‍රමුඛ විය.

**(ලකුණු 16 යි)**

7. "දෙවන චන්ද්‍රගුප්ත රජු විසින් ගුප්ත අධිරාජ්‍යය උච්චස්ථානයට පත්කරන ලදී."

(i) දෙවන චන්ද්‍රගුප්ත රජුගේ මව සහ පියා නම් කරන්න. (ලකුණු 02 යි)

මව - දත්තා දේවිය.

පියා- සමුද්‍රගුප්ත රජු.

**(ලකුණු 02 යි)**

(ii) දෙවන චන්ද්‍රගුප්ත රජු සමයේ දී ඉන්දියාවට පැමිණි චීන භික්ෂුව නම් කරන්න. (ලකුණු 01 යි)

චීන දේශාටක පාහියන් භික්ෂුව.

**(ලකුණු 01 යි)**

(iii) ගුප්ත අධිරාජ්‍යයේ උන්නතිය උදෙසා දෙවන චන්ද්‍රගුප්ත රජු පැවැත්වූ විවාහ සම්බන්ධතා පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 03 යි)

දෙවන චන්ද්‍රගුප්ත රජු අධිරාජ්‍යයේ උන්නතිය උදෙසා විවාහ සබඳතා තුනක් පැවැත් වූ බවට මූලාශ්‍රගත තොරතුරු ලැබේ. එනම්

1. නාග වංශික කුවේර නාගා කුමරිය විවාහ කොට ගෙන නාග වංශික ප්‍රදේශ ගුප්ත අධිරාජ්‍යයට සම්බන්ධ කොට ගැනීම.
2. චන්ද්‍රගුප්ත රජුගේ බිසවක් වූ කුවේර නාගා බිසවගෙන් ලද ප්‍රභාවතී ගුප්තා කුමරිය
   වාකාටක වංශයේ දෙවන රුද්‍රසේන රජුට විවාහ කොට දීම
3. කදම්භ වංශික පාලකයෙකු වූ කාකුත්ස්ථවර්මන් රජුගේ කුන්තලයේ කදම්භ කුමරිය දෙවන චන්ද්‍රගුප්ත රජුට විවාහ කර දීම.

**(ලකුණු 03 යි)**

(iv) දෙවන චන්ද්‍රගුප්ත රජු ගුප්ත අධිරාජ්‍යය උච්චස්ථානයට ගෙන ආවේ කෙසේ දැයි සාකච්ඡා කරන්න. (ලකුණු 10 යි)

- ගුප්ත අධිරාජ්‍යයේ ප්‍රබල රජෙක් වූ දෙවන චන්ද්‍රගුප්ත රජතුමා සමුද්‍රගුප්ත අධිරාජයාගේ අභාවයෙන් පසු ක්‍රි. ව.380දී රාජ්‍යත්වයට පත්වූයේ ව්‍යාකූල දේශපාලන පසුබිමක් සහිතවයි.
- තත් කාලවකවානුවේ ඔහුගේ දේශපාලන, ආර්ථික අභිවර්ධනයේ වැදගත්කම පෙන්වමින් දේවගුප්ත, දේවරාජ, දේවශ්‍රී වික්‍රමාදිත්‍ය, පරමභට්ටාරක යන අභිමානවත් උපාධි නාමයන්ගෙන් ඔහු හැඳින්විය.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ඔබට ලබාගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- ගුප්ත අධිරාජ්‍යය උච්චස්ථානයට ගෙන ඒම සඳහා දෙවන චන්ද්‍රගුප්ත රජතුමා දේශපාලන බල ව්‍යාප්තියත්, භාෂා සාහිත්‍ය, ආගමික හා ආර්ථික සංවර්ධනයත් ඇති කිරීමට දායකත්වය ලබා දුන්නේය.
- යුදමය ක්‍රියා මාර්ග මෙන්ම මිත්‍රශීලී විවාහ සම්බන්ධතා මගින්ද ගුප්ත අධිරාජ්‍යයේ දේශපාලන බලය ව්‍යාප්ත කිරීමට දෙවන චන්ද්‍රගුප්ත රජු පසුබට නොවීය.
- මෙතෙක් කාලයක් ගුප්ත අධිරාජ්‍යයේ නැගීමට මහත් බාධාවක් වූ බටහිර ඉන්දියාවේ ශතවර්ෂ තුනකට අධික කාලයක් පැවති ශක ක්ෂත්‍රප බලය මර්දනය කරන්නට දෙවන චන්ද්‍රගුප්ත රජුට හැකිවූ බව වීරසේනගේ උදයගිරි ලිපිය, සනකානික මහාරාජාගේ භිල්සා ලිපිය, අමාර්කාර්දවගේ සාංචි ලිපිය සාක්ෂි සපයයි.
- දිල්ලි කුතුබ්මිනාර් ස්මාරකය අසල ඇති ලෝහමය ස්ථම්භයක කෙටවූ ලිපියකින් කියවෙන්නේ වංග දේශයේ සතුරු නායකයින් රැසකගේ සන්ධානයක් හා සින්ධු නදී මුවදොර තරණය කොට වාහ්ලිකයන්ද පරාජය කිරීමට දෙවන චන්ද්‍රගුප්ත රජුට හැකිවූ බවයි.
- හින්දුකුෂ් කඳුවැටියෙන් ඔබ්බෙහි වාහ්ලිකයින් සිටි ප්‍රදේශය බැක්ට්‍රියා (බෝල්ඩ්, බල්ක්) ලෙස හඳුනාගෙන තිබේ. මේ අනුව ඉන්දියාවෙන් බැහැරට ආක්‍රමණයක් එල්ල කළ එකම ගුප්ත පාලකයා වන්නේ දෙවන චන්ද්‍රගුප්ත රජතුමාය.
- දිල්ලි කුතුබ්මිනාර් ස්ථම්භ ලිපියද බෙංගාල බොක්කේ සිට හින්දුකුෂ් කඳුවැටියෙන් ඔබ්බට දෙවන චන්ද්‍රගුප්ත රජුගේ බලය ව්‍යාප්තව පැවැති බවට සාක්ෂි සපයයි.
- ගුප්ත අධිරාජ්‍යයේ අමාත්‍යවරයෙකු වූ ශාතිගේ අභිලේඛනයක දෙවන චන්ද්‍රගුප්ත රජු මුළු ලොව දිනීම සඳහා ගමන් කළ බව කියවේ. අමර්කාර්දවගේ අභිලේඛනවල දැක්වෙන්නේ දෙවන චන්ද්‍රගුප්ත රජු සටන් රාශියක් දිනා කීර්තියක් අත්පත් කොට ගත් බවයි.
- දෙවන චන්ද්‍රගුප්ත රජතුමා නැගෙනහිර හා බටහිර ඉන්දීය ප්‍රදේශ ජයගැනීම දේශපාලන ජයග්‍රහණයක් පමණක්ම නොවීය. එය බෙංගාල බොක්ක හා අරාබි මුහුද අතර වාණිජ වරායන් පාලනය කිරීමේ ආර්ථික බලය හිමි වූ ජයග්‍රහණයක්ද විය.
- දෙවන චන්ද්‍රගුප්ත සමයට අයත් විවිධ වර්ගයේ රන් රිදී හා ලෝකඩ කාසි මගින්ද ගුප්ත අධිරාජ්‍යයේ දේශපාලන බල ස්ථාවරත්වය මෙන්ම ආර්ථික සමෘද්ධිය කියාපායි.
- ගුප්ත අධිරාජ්‍යය උච්චස්ථානයට පත්වීම පාහියන් භික්ෂුව වාර්තා කොට ඇත්තේ ජනහිතකාමීවූත්, සෞම්‍යවූත් දෙවන චන්ද්‍රගුප්ත පාලනය හේතුවෙන් ඉන්දියාව පාලනය කිරීමට දැඩි නීති අවශ්‍ය නොවූ බවයි.
- දේශපාලනික හා ආර්ථික ක්ෂේත්‍ර පමණක් නොව භාෂා සාහිත්‍යමය වශයෙන්ද ගුප්ත අධිරාජ්‍යය උච්ච ස්ථානයකට ගෙන ඒමට දෙවන චන්ද්‍රගුප්ත රජුට හැකියාව ලැබුණි. මෙකල සිටි සාහිත්‍යධරයන් නම්.

  කාලිදාස - රඝුවංශය, කුමාරසම්භවය, මේඝදූතය, ඍතු සංහාරය, මාලවිකාග්නිමිත්‍ර, ශාකුන්තලය.

  විශාඛදත්ත- මුද්‍රාරාක්ෂය, දේවීචන්ද්‍රගුප්තා.

  අමරසිංහ - අමරකෝෂය.

  වරාහමිහිර - බ්‍රහද්සංහිතා.

  ආර්යභට - සූර්යසිද්ධාන්තය.
- පාණිනීගේ හා පතංජලීගේ ව්‍යාකරණ සංස්කරණය හේතුවෙන් සංස්කෘත භාෂාව සුබනම්‍ය වීම.
- බ්‍රාහ්මණ ආගම සංවර්ධනය වීමට අනුග්‍රහ දැක්වීම් මගින් බ්‍රාහ්මණ සහාය ලැබීම.

**(ලකුණු 10 යි)**

8. රාජේන්ද්‍ර චෝළ රජු කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් චෝළ පාලකයන්ගේ යුද ජයග්‍රහණ විස්තර කරන්න. (ලකුණු 16 යි)

- විජයාලය රජු තන්ජෝරය අල්ලා ගැනීමත් සමඟ චෝළ අධිරාජ්‍යයේ ආරම්භය සිදුවිය. ඉන් අනතුරුව පළමුවන ආදිත්‍ය පල්ලවයන් පරාජය කර කොණ්ඩයි මණ්ඩලම් ප්‍රදේශය යටත් කරගත් අතර කොංගු හා තලකාඩ් ප්‍රදේශයද අල්ලා ගත්තේය.
- ඉන්පසුව පාණ්ඩ්‍ය රජුගේ අගනුවර වූ මධුරාව ජයගනී. වෙල්ලූර් සටනින් පසුව වෙල්ලෝරයේ බලයද අල්ලා ගනු ලැබීය.
- රාජාදිත්‍ය, භණ්ඩාරාදිත්‍ය, දෙවන පරන්තක, දෙවන ආදිත්‍ය ආදී දුර්වල පාලකයන් නිසා වසර 30ක් පමණ චෝළ බලයේ පිරිහීමක් දක්නට ලැබේ.
- අනතුරුව පළමුවන රාජරාජ රජු චෝළ බලය ව්‍යාප්ත කිරීමට දායකවේ. ප්‍රථම ජයග්‍රහණය ලෙස ත්‍රිවැන්ද්‍රම්හි භාෂ්කර රාජවර්මන් යටතේ තිබූ කේරළ නාවික හමුදාව පරාජය විය. මධුරාව ජයගෙන උදගෙයි බලකොටුව යටත් කර ගැනීම, ගංගවාඩිය, කංගාවාඩිය, කෝලම්භවාඩිය යන ප්‍රදේශද අල්ලා ගනු ලැබීය.
- කාලිංග ජයගැනීම, ලංකාවේ අනුරාධපුරය අල්ලා ගැනීම, මාලදිවයින අල්ලා ගැනීම.
- ඔහුගේ පුත් පළමුවන රාජේන්ද්‍රද යුධ ජයග්‍රහණ රැසක් ලබා ගත්තේය. පියා සමඟ එක්ව යුද ජයග්‍රහණ රැසක් මේ වන විට ලබා තිබූ නිසා එම අත්දැකීම්ද සමග යුධ ජයග්‍රහණ සිදුකර තිබේ.
  - තිරුවාලංගාඩු සෙල්ලිපිය, තිරුමලෙයි සෙල්ලිපිය.
- ඔහු ඉන්දියාවේ දකුණු ප්‍රදේශය හැරුණු කොට ලංකාවේ උතුරු කොටස, මාලදිවයිනේ සන්දිමන්ත්‍රිවු දූපත, බෙංගාලයේ නැගෙනහිර හා දකුණු ප්‍රදේශ යටත් කර ගනු ලැබීය.
- ලංකාවේ උතුරු ප්‍රදේශය චෝළ යටත් විජිතයක් බවට පත් වූ අතර එය මුම්මුඩි චෝළ මණ්ඩලම් ලෙස හැඳින්විය. පොළොන්නරුව ජනනාථපුරම් ලෙස හඳුන්වා ඇත. (පස්වැනි මිහිඳු රජු සිරකරුවකු බවට පත් විය).
- කේරළය යටත් කොට එහි පාලනයට තම පුතු පත් කළේය. තුංගභද්‍රා ගඟෙන් උතුරට හමුදාව මෙහෙයවා ජය ලබා ඉන් අනතුරුව ගංගෙයි කොණ්ඩ යන විරුදය භාවිත භාවිතයට ගෙන තිබේ.
- අග්නිදිග ආසියාවේ සමුද්‍රාසන්න ප්‍රදේශවලට ආක්‍රමණ එල්ල කොට නිකොබාර් දූපත්, ශ්‍රී විජය රාජ්‍යයේ කඩාරම් කොටුව අල්ලා ගනු ලැබීය. එතැන් සිට කඩාරම් කොණ්ඩෙ යන විරුදය භාවිතයට ගනු ලැබීය.
- විශාල වශයෙන් යුධ ව්‍යාපාර මෙහෙයවා ඉන්දියාවේ පමණක් නොව ඉන්දීය සාගරයේ පැවති ප්‍රදේශ ගණනාවක් යටත් කර ගනු ලැබීය.

**(ලකුණු 16 යි )**

9. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑ ම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

   (i) ස්කන්ධගුප්ත රජු
   (ii) ත්‍රිකෝණ අරගලය
   (iii) පල්ලව කලාව හා ගෘහනිර්මාණ ශිල්පය
   (iv) අරාබි සහ තුර්කි ආක්‍රමණ

(ලකුණු 08 × 2 = 16 යි)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(I). **ස්කන්ධගුප්ත රජු**

- පළමුවැනි කුමාරගුප්ත රජුගේ පුතයා සහ අනුප්‍රාප්තිකයා විය. ස්කන්ධගුප්ත රජු ගුප්ත අධිරාජ්‍යයාගේ අවසාන ශ්‍රේෂ්ඨ පාලකයා ලෙසද සැලකේ.
- ඔහු වික්‍රමාදිත්‍ය සහ ක්‍රමාදිත්‍ය යන විරුද භාවිතා කර ඇත.
- පුෂ්‍යමිත්‍ර තර්ජනය මැඩ පැවැත්වීම සහ හූණ ආක්‍රමණ පරාජය කිරීම විශේෂ ජයග්‍රහණ වේ. විශේෂයෙන් ගාන්ධාර ප්‍රදේශයට එල්ල වූ හූණ ආක්‍රමණ මර්ධනය කිරීම වැදගත්වේ.
- බෙංගාලයේ සිට කතියවාරය තෙක් උතුරු ඉන්දියානු ප්‍රදේශ මොහුගේ රාජ්‍යයට අයත් වූ බවට සැලකේ.
- ක්‍රි. ව. 455 සිට ක්‍රි. ව. 467 දක්වා රාජ්‍ය පාලනය කළ අතර ස්කන්ධගුප්ත රජුගෙන් පසුව පුරුගුප්ත රජ විය.
- ගිර්නාර් කඳු ශිඛරයේ පිහිටි සුදර්ශන වැව පර්නදත්ත නම් ප්‍රාදේශීය පාලකයා ලවා පිළිසකර කරවීම වැනි සුබසාධක කටයුතු සිදුකර ඇත.
- ස්කන්ධගුප්තගේ යුද ජයග්‍රහණ නිසා ගුප්ත අධිරාජ්‍යයට බාහිර ආක්‍රමණවලින් වැලකී ආරක්ෂිතව සිටිය හැකි විය.
- යුධ ජයග්‍රහණ මගින් පාලනය ස්ථාවර කළද ඒ සඳහා වැය කළ අධික වියදම් නිසා රට ආර්ථික වශයෙන් නගා සිටුවීමට පසුව කටයුතු කර තිබේ.

**(ලකුණු 08 යි )**

(II). **ත්‍රිකෝණ අරගලය**

හර්ෂවර්ධන රජුගේ ඇවෑමෙන් කනෞජයේ බලය ලබා ගැනීමට රාජවංශ තුනක් ගැටුණු අතර එය ත්‍රිකෝණ අරගලය ලෙස හඳුන්වයි.

1. බටහිර ඉන්දියාවේ රාජ්පුටානාවේ ගුර්ජර ප්‍රතිහාර
2. නැගෙනහිර ගංගා නිම්නයේ පාලවරු
3. බටහිර ඩෙකෑනයේ මහාරාෂ්ට්‍රයේ රාෂ්ට්‍රකූටවරු

මෙම ගැටුමට මුල් වූ රාජවංශ වේ.

- උතුරු ඉන්දීය ප්‍රදේශවල පැවති සශ්‍රීකත්වය හේතුවෙන් කනෞජය ජයගැනීම සඳහා මෙම අරගලය සිදු විය.
- දකුණුදිග ප්‍රතිහාරවරුන් හා ඩෙකෑනයේ රාෂ්ට්‍රකූටවරුන් ගංගා නිම්නයේ ධර්මපාල රජු පරාජය කරන ලදී. (ක්‍රි. ව. 783)
- ගුර්ජර ප්‍රතිහාර වත්සරාජ රජු තම සටන් කනෞජය දක්වා ගෙනයන ලදී. රාෂ්ට්‍රකූට පාලක ධ්‍රැව රජු ප්‍රතිහාර රාජ්‍යයට පහරදීම නිසා ඊට මුහුණදීමට වත්සරාජ ආපසු ගියේය. එයත් පරාජය වූ ඔහු රාජ්පුටානාවට පළාගියේය.
- පසුව රාෂ්ට්‍රකූට පාලක ධ්‍රැව රජු බෙංගාලය ආක්‍රමණය කොට ධර්මපාල රජු පරාජය කළේය. එහෙත් ඔහුට හදිසියේ ඩෙකෑනයට යාමට සිදුවූ නිසා ඉතිරි දෙපක්ෂය අතර සටන සිදුවිය.
- මෙහිදී කනෞජය අල්ලාගත් ධර්මපාල තමාට අවනතව සිටි චක්‍රායුධ එහි පාලකයා බවට පත්වීම නිසා උතුරු ඉන්දියාව එම ආධිපත්‍යය පිළිගනු ලැබීය.
- නමුත් වත්සරාජගේ පුත් දෙවැනි නාගභට විසින් ධර්මපාල පරාජය කිරීම සිදුවිය. එහිදී රාෂ්ට්‍රකූට පාලක තුන්වැනි ගෝවින්ද උතුරු ප්‍රදේශය ආක්‍රමණය කොට නාගභට පරාජය කරන ලදී.

PAST PAPERS WIKI

- ➢ කනෞජයේ බලය ධර්මපාල රජුගේ අනුග්‍රහය ලත් කණ්ඩායමක් අතට පත් විය.
- ➢ ක්‍රි. ව දහවන සියවසේදී රාජවංශවල දුර්වලකම නිසා බල අරගලය අවසන් විය. ඔවුන්ගේ බලය ඉන් පසු ඒ ඒ ප්‍රදේශවලට සීමාවන අතර පසුව ඒවායේ බලය වෙනත් කණ්ඩායම් විසින් දිනා ගැනීම සිදුවිය.
- ➢ ඒ අනුව රාෂ්ට්‍රකූට ප්‍රදේශය චාලුක්‍යයන්ටද බෙංගාලය සේනවරුන්ටද ප්‍රතිහාර රාජ්‍යය කුඩා කොටස්වලටද බෙදී ගියේය.
- ➢ මෙම අරගල නිසා උතුරේ ප්‍රබල රාජ්‍යයක් ගොඩනගා ගැනීම වැළකුණි. දේශපාලන එක්සත් බවක් නොවූ නිසා අවසානයේදී විදේශ ආක්‍රමණ පවා ඉන්දියාවට එල්ල විය.

**(ලකුණු 08 යි)**

(III). **පල්ලව කලාව හා ගෘහනිර්මාණ ශිල්පය**

- ➢ දකුණු ඉන්දියානු ගෘහනිර්මාණ ශිල්පයේ ශ්‍රේෂ්ඨ අවධියක් වන මේ යුගය ප්‍රධාන වර්ධනීය අවස්ථා දෙකකින් සමන්විත වේ.
- ➢ පර්වත හාරා කරන ලද නිර්මාණ

  මෙම නිර්මාණ අවධි දෙකක් යටතේ විකාශනය විය. පළමුවන මහේන්ද්‍රවර්මන් රජු දවස පර්වත හාරා දේවාල තැනීමේ සම්ප්‍රදාය යටතේ කුළුණු සහිත ලෙන් දේවාල ඉදිකිරීම පළමු අවධියයි.
- ➢ දෙවන නරසිංහවර්මන් රාජ්‍ය කාලයේ විසිතුරු මණ්ඩප හා රථ දේවාල ඉදිකිරීම දෙවන අවධියයි. එහි මණ්ඩපවල කුළුණු පෙළ කැපී පෙනෙන අංගය වේ. ඒවායේ දේව රූප, සත්ව රූප යොදා අලංකාර කර ඇත. රථ දේවාලවලට නිදසුන් මාමල්පුරම්වලින් දක්නට ලැබේ. පර්වත හාරා ඉදිකළද දැවයෙන් කළ නිර්මාණ මෙන් ඉතාමත් අලංකාර ලෙසට කර ඇත. සහදේව, ගණේෂ හා භීම යන රථ දේවාල චෛත්‍ය සම්ප්‍රදායෙන් නිම කර ඇත.
- ➢ දෙවන අවධියට අයත් කළු ගල් භාවිත කර දේවාල ඉදිකිරීම ශෛලීන් දෙකක් යටතේ සිදුවිය.

  1 මාරවර්මන් රාජසිංහ ශෛලිය යටතේ කළ නිර්මාණ.

  2. නන්දිවර්මන් ශෛලිය යටතේ කළ නිර්මාණ.
- ➢ කළුගල් යොදා ඉදිකළ දේවාල මහාමල්ලපුරම් හා කාංචිපුරයේ දක්නට ලැබේ. කාංචිපුරයේ කෛලාශනාථ දේවාලය වෛකුණ්ඩපෙරුමාල් දේවාලය මාමල්ලපුරයේ වෙරළබඩ ඊෂ්වර දේවාලය විශිෂ්ට නිර්මාණ වේ.
- ➢ දේවාලය වටා කළ ප්‍රාකාරය, ගර්භ ගෘහය, අලංකාර මණ්ඩපය, පිරමීඩාකාර වහලය, ස්තූපාකාර හැඩයක් ගත් කොත, අලංකාර රූකම් සහිත කුළුණු මේවායේ විශේෂ ලක්ෂණ වේ.
- ➢ දේවාල ඇතුළත හා පිටත බිත්ති විෂ්ණු, දූර්ගා, ලක්ෂ්මී වැනි හින්දු දෙවි දේවතාවියන්ගේ මූර්තිවලින් සරසා නිම කර ඇත. ඇතැම් අවස්ථාවල රජවරුන් හා බිසෝවරුන්ගේ ප්‍රතිමාද ඉදිකර ඇත. කෛලාශනාථ දේවාලයේ එම ප්‍රතිමා දක්නට ලැබේ.
- ➢ දේවාල වටා ඇති ප්‍රාකාරවල පිට පැත්ත චාම් ලෙස කැටයම් කර ඇති අතර ඇතුළු පැත්තේ පල්ලව ඉතිහාසයේ වැදගත් සිද්ධි මූර්තිමත් කර ඇත.
- ➢ මාමල්ලපුරයේ කඳු බෑවුමක නිර්මාණය කර ඇති කැටයම අර්ජුනගේ තපස් රැකීම නමින්ද පසුව ගංගා නදියේ අවරෝහණය නමින්ද හඳුන්වා ඇති අවස්ථා පල්ලව කලාවේ වැදගත් අවස්ථාවන් පිළිබිඹු කෙරේ.
- ➢ එහි නිරූපිත නාග, මුව, ඇත්, වඳුරු රූප මෙන්ම මිනිස් රූපද සජීවී බවකින් යුක්තය.

**(ලකුණු 08 යි)**

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(IV). **අරාබි සහ තුර්කි ආක්‍රමණ**

- වෙළෙඳ සබඳතා නිසා අරාබිවරුන්ට ඉන්දියාව පිළිබඳ අවබෝධයක් ඇති විය. එම නිසා අරාබිවරු හා ඉන්දියානුවන් අතර පැවති සම්බන්ධතා මුල් කාලයේදී සාමකාමී විය.
- අරාබිවරුන් තුළ පසුව ඇති වූ ඉස්ලාම් ධර්මය ව්‍යාප්ත කිරීමේ බලාපොරොත්තුවත් වෙළෙඳ අවශ්‍යතාවයනුත් නිසා ඉන්දියාව ආක්‍රමණයට කිරීමට පෙළඹුණි.
- මදීනාවේ කාලිෆ් වංශයේ දෙවැන්නා වූ ඕමාර් කාලිෆ් දවස මුල්ම ආක්‍රමණය සිදු විය. බොම්බායේ තානාවලට එල්ල කළ මුල්ම ආක්‍රමණය අසාර්ථක විය.
- දෙවනවර ඔවුන් බ්‍රෝච් හා දෙබාල්වලට එල්ල කළ ආක්‍රමණද අසාර්ථක විය. නමුත් ඔවුන්ගේ තුන්වන ආක්‍රමණය මුහම්මද් බින්- කාසිම් යටතේ එල්ල වන අතර එමගින් සින්ද් හා මුල්තාන් අල්ලා ගැනීමට සමත් වේ.
- එමගින් ප්‍රථම වරට ඉන්දියන් ප්‍රදේශයක් අරාබි පාලනය යටතට පත්විය.
- අරාබීන් විසින් අල්ලාගත් මෙම බටහිර ඉන්දියානු ප්‍රදේශ සේනා සංයුක්ත පාලන ක්‍රමයක් මගින් සියවස් එක හමාරක් පමණ පාලනය විය.
- වයඹදිග දුර්ග මාර්ග ඔස්සේ ඉන්දියාවට ඇතුළු වූ තුර්කි ආක්‍රමණිකයන්ගේ පුරෝගාමියා ලෙස සැලකෙන්නේ සබුක්තිජින්ය. ක්‍රි.ව. 997දී ඔහුගේ මරණය සිදුවන විට වයඹ ඉන්දීය පිවිසුම් කපොලු කිහිපයක් හා ඒ අවට ප්‍රදේශ කිහිපයක්ම මුස්ලිම්වරුන් අත විය.
- සබුක්තිජින්ගෙන් පසුව ඔහු පුත් මහමුද් සස්නිහි පාලකයා බවට පත් විය. ඔහු කාබුල් හා කන්දහාර් ඈඳාගෙන තම රාජ්‍යය ස්ථාවර කර ගත්තේය.
- සස්නි මහමුද් දාහත් (17) වතාවක් පමණ ඉන්දියාව ආක්‍රමණය කරමින් තුර්කි ඇෆ්ගන් බලය ඉන්දියාවේ පැතිරවීමට ක්‍රියා කළ අතර ධනය කොල්ලකෑමද සිදුකළේය. ඒ අතර රාජ්පුත් පාලක ජයපාල පරාජය කර ථානේශ්වරය අල්ලා ගැනීමද සිදු විය. සෝමනාථ දේවාලයේ ධනය කොල්ලකා විනාශ කර දැමීය.
- ක්‍රි.ව. 1175දී ඝෝර්හි මුහම්මද් යටතේ ඉන්දියාවට ආක්‍රමණ එල්ල විය. එහිදී මුල්තාන් රාජ්‍යය ජයගන්නා අතර සින්ද් හා පංජාබය පුරා බලය පැතිරවිය.
- අජ්මේර්හි චෞහාන් රාජවංශික පෘථිවිරාජට තරේන්හිදී දරුණු පරාජයකට පත් කළේය. කනෞජ්හි ජයචන්ද්‍ර රජු පරාජයට පත්කර බෙංගාලය දක්වා බලය පැතිරවීම සිදුවිය.
- මෙම ජයග්‍රහණවලින් පසුව නැගෙනහිර ඉන්දියාව ආක්‍රමණය කර වැදගත් ස්ථාන කිහිපයක බල කඳවුරු පිහිටුවාගෙන ස්ථිර බලයක් ගොඩනගා ගැනීමට සමත් විය.
- ඝෝර්හි මුහම්මද්ගේ මරණයත් සමග කුතුබ්-උද්- දීන් -අයිබෙග් දිල්ලියේ සුල්තාන්වරයා ලෙස ප්‍රකාශයට පත් කළේය. ඔහුගෙන් වහල් රජ පෙළපත ආරම්භ විය.
- එතැන් සිට ඉන්දියාව තුළ මුස්ලිම් බලය ක්‍රමයෙන් වර්ධනය වූ අතර ඉස්ලාම් ආගම මෙන්ම ඉස්ලාම් සංස්කෘතිය පැතිරවීමද සිදු විය.

**(ලකුණු 08 යි)**

***